ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**

30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකः 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **සන්නිවේදන දෙපාර්තමේන්තුව** |
| දිනය | **2015 ජූනි මස 11 වැනි දින** |

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති හා අනුකූලතා කටයුතු දෙපාර්තමේන්තුව පිහිටුවීම

ශ්‍රී ලංකාවේ මූල්‍ය ක්ෂේත්‍රයේ ප්‍රමුඛ ආයතනය ලෙස වර්ෂ 1950 දී ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුව බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන සුපරීක්ෂණය හා අධීක්ෂණය පිළිබඳව බලය පවරා ඇති ව්‍යවස්ථා කිහිපයක් යටතේ වගකීම් ඉටු කරනු ලබයි.

තවද ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමට අදාලව මූල්‍ය බුද්ධි ඒකකය පිහිටුවීමත් සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අධීක්ෂණය කරනු ලබන නෛතික හා අනුකූලත්ව කරුණු ද විවිධ හා සංකීර්ණ වි ඇත. මීට අමතරව විද්‍යුත් ගෙවීම් පද්ධතිවල වර්ධනයත් රාජ්‍ය ණය උපකරණ නිර්ලේඛණගත ලෙස නිකුත් කිරීමත් සමගම නෛතික හා අධීක්ෂණ කරුණු ගණනාවක් මැනවින් අධ්‍යනය කිරීම සහ විශ්ලේෂණය කිරීම අවශ්‍ය වී ඇත. අන්තර්ජාතික මූල්‍ය ක්ෂේත්‍රයේ වර්ධනය මගින්ද එම කාරණාවන්ට අදාල වන්නා වූ නීතිමය කරුණු පිළිබඳව පරීක්ෂා කිරීම අවශ්‍යකරනු ලැබ ඇත.

මෙහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ක්ෂේත්‍රයට අදාල විවිධ නීති රීතීන් යටතේ පනවා ඇති වගකීම් නිසිලෙස ඉටුකිරීමට අදාළ පුළුල් සහ සංකීර්ණ කරුණු පිළිබඳව අවධානය යොමු කළ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මුදල් නීති පනතේ 33 වන වගන්තිය ප්‍රකාරව නීති සහ අනුකූලතා කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවක් ස්ථාපනය කරන ලදී. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව බැංකුව තුල නීතිරීතීන්ට අනුකූලව කටයුතු කෙරෙන සංස්කෘතියක් බිහිකිරීමේ අරමුණින් පුළුල් පරාසයක පැතිරුණු කරුණු රැසක් පිළිබඳව කටයුතු කරනු ඇත.

මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කොට ඇති නීති ක්ෂේත්‍රයෙහි සුදුසුකම් හා පුහුණුව ලද, ආර්ථික හා මූල්‍ය විෂයයන්හි දැනුම සහිත නිලධාරීන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තුවලට උපදෙස් දීමට සහ අධිකරණ හා වෙනත් නීතිපර්ෂද ඉදිරියෙහි බැංකුව නියෝජනය කිරීමටද නියමිතය.

තවද මහ බැංකු සහ මූල්‍ය පද්ධති ස්ථායීතා පිළිබඳ දැනුමැති එම නිලධාරීන් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය පිළිබඳ යෝජිත නීති ප්‍රතිසංස්කරණ සහ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ අන්තර්ජාතික සමාලෝචනයන් සිදුකරන අතර බැංකු සහ මූල්‍ය ක්ෂේත්‍රන්යට අදාල නීතිය සංවර්ධනය කිරීමට ද කටයුතු කරනු ඇත.

මූල්‍ය පද්ධති ස්ථායීතාව, මූල්‍ය වෙළඳපොල ක්‍රියාකාරීත්වය සහ ගෙවීම් හා පියවීම් පද්ධති පිළිබඳ නීතිය හා භාවිතයට අදාළ රජයේ දෙපාර්තමේන්තු සහ අනෙකුත් නියාමන ආයතන සමග අවබෝධයක් ඇතිකර ගැනීම හා මූල්‍ය පද්ධතියට අදාල නීති ක්‍රියාත්මක කිරීම පිළිබඳවත් නීති හා අනුකූලතා පිළිබඳ දෙපාර්තමේන්තුව පිහිටුවීම මගින් අනුබලයක් ලැබෙනු ඇතැයි බලාපොරොත්තු වේ.